**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| (i) 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාවේ මහ ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය දක්වා ඇත. ඉදිරියේ දී වෙනම කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | කාර්ය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතුය. |
| (ii) 40(1) වගන්තිය | අභ්‍යන්තර විගණනය සිදුකිරීම හා එම අස්ථිතයේ පාලක සභාව විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, මහලේකම් කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර | ජාතික මහ ලේකම් කාර්යාලය කාන්තා හා ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අංශයක් ලෙස දැනට ක්‍රියාත්මක වන බැවින් හා ඒ සඳහා සැළකිය යුතු වියදමක් දැරීමට සිදුවන | මහලේකම් කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | බැවින් වෙනම අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීම හා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම අනවශ්‍ය බවත් තවදුරටත් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් අභ්‍යන්තර විගණනය ඉටු කරවා ගැනීම සුදුසු බවත් ජාතික සභාව තීරණය කරන ලදී. | |
| (iii) 40(2) වගන්තිය | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති අවස්ථාවකදී මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර 02ක් නොඉක්මවන කාල සීමාවක් තුල එම පත්කිරීම සිදුකල යුතු වුවත් එසේ කර නොතිබුණි. අනුමත කාර්යය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුර කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබුණු හෙයින් එසේ පත්කිරීම් සිදුකිරීමට නොහැකි වී තිබුණි. | වෙනම අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීම සඳහා සැළකිය යුතු වියදමක් දැරීමට සිදුවන බැවින් වෙනම අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීම අනවශ්‍ය බවත් තවදුරටත් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් අභ්‍යන්තර විගණනය ඉටු කරවා ගැනීම සුදුසු බවත් ජාතික සභාව තීරණය කරන ලදී. | මහලේකම් කාර්යාලයෙ අනුමත කාර්යය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුර අනුමතකර ගෙන බඳවා ගැනීමට කටයුතු කල යුතුය.. |
| (iv) 41 වගන්තිය | පාලක මණ්ඩලය විසින් තමාට සහය දීම පිණිස විගණන හා කලමනාකරණ කමිටුවක් පත්කල යුතු වුවත් , ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය විසින් පාලක මණ්ඩලයට සහය දීම පිණිස විගණන හා කලමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. එම කටයුතු රේඛීය රාජ්‍ය අමාත්‍යාංශයේ විගණන හා කලමනාකරණ කමිටුවේ කාර්යය කටයුතු වලට පමණක් සීමා වී තිබුණි. | ජාතික මහලේකම් කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීම හා වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කිරීම අවශ්‍ය නොවන බව ජාතික සභාව විසින් තීරණය කර ඇත.කෙසේවෙතත් ඉදිරියේ දී විගණන හා කළමනාකරණ රැස්වීම්වල තීරණ ජාතික සභා රැස්වීම් වෙත යොමු කර ගැටළු නිරවුල් කර ගැනීමට හා අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මහලේකම් කාර්යාලය සඳහා විගණන හා කලමනාකරණ කමිටුවක් පත්කල යුතුය. |
| (ආ)1996 28 දරන ආබාධ තැනැත්තන්ගේ අයිතිවාසිකම් | පාලක සභාව යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු වුවද, 2019,2020,2021 වර්ෂය තුලදී පිළිවෙලින් රැස්වීම් වාර 2ක්, 2ක් හා 4 ක් බැගින් | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන පනවනු ලැබූ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව මහජන ඒකරාශීවීම් සීමිත කිරීමට සිදු | පනතේ දැක්වෙන විධිවිධාන පරිදි පාලක සභාවේ රැස්වීම් වාර අවම ගනණ හෝ පැවැත්වීමට පියවර |

| | | | |
|---|---|---|---|
| ආරක්ෂා කිරීම පනතේ 7(3) වගන්තිය | පමණක් පවත්වා තිබුණි | වූ හෙයින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභා රැස්වීම් ද සීමිත ප්‍රමාණයක් පවත්වන ලදී. | ගත යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.396 (ඇ) | මාස 06කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.138,764ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 05ක් සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ දී පැවති වසංගත තත්ත්වය නිසා චෙක්පත් කල් ඉකුත් වීමට ප්‍රථම නිශ්කාශනය කිරීම සඳහා බැංකු වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. මේ වන විට එම චෙක්පත් දින දීර්ඝ කිරීම හා නව චෙක්පත් ලබාදීම සිදු කර ඇත. | කාලයක් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධින ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.183,179 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,266,192 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,449,371ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රධාන හා සුපිරි වාසනා ලොතරැයි ආදායම රු.10,800,524 ක් හා ආධාර ව්‍යාපෘති වියදම් රු.3,002,398 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අංක 16/1743/711/030 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ආබාධ සහිත තැනැත්තන්ගේ නිවාස ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහනට අරමුදල් සම්පාදනය වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වනු ලබන " සුපිරි වාසනා සම්පත "ලොතරැයි ආදායමෙන් | "සුපිරි වාසනා සම්පත" ලොතරැයි ආදායමෙන් 5% ක් ලෙස නිවාස අරමුදලට භාණ්ඩාගාරයෙන් ලබා දෙනු ලබන මුදල පිළිබඳව සෑම වර්ෂයක් අවසානයේදීම අදාළ මාස අනුව විස්තරයක් භාණ්ඩාගාරයෙන් ගෙන්වා ගනු ලැබේ. ඒ අනුව හිඟ මුදල් ගණනය කර හිඟ ආදායම ගිණුම්ගත කරනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් හා ලබාදීමට එකහවූ මුදල එම වර්ෂයේ "සුපිරි වාසනා සම්පත" ලොතරැයි ආදායමෙන් 5% ක මුදල බව අවිශ්වාස කිරීමට | ලොතරැයි ආදායම නිසි ලෙස අයකර ගැනීමට හා නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 5ක මුදලක් අයකරගත යුතුව තිබුණි. එකී ආදායම් නිවැරදි ලෙස ඇස්තමේන්තු කිරීම් හා ගණනය කිරීම් සිදුකර තථ්‍ය ආදායම , අයකර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කරනු වෙනුවට මහාභාණ්ඩාගාරයෙන් ලබාදීමට එකඟ වූ හා ලබාදී තිබුණු මුදල පදනම් කරගෙන වර්ෂයේ අදායම හා ලැබිය යුතු හිඟ ආදායම ගිණුම්ගත කර තිබුණි. | ප්‍රමාණවත් කරුණු නොමැති හෙයින් ද භාණ්ඩාගාරයේ හා ලොතරැයි මණ්ලයේ කටයුතු විගණනයේ දී පරීක්ෂා කරන බැවින් ද භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලබන තොරතුරු ගිණුම් සැකසීමේ දී උපයෝගිකර ගනු ලැබේ. | |
| (ආ) ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම , සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභසිද්ධිය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදතාවකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, අබාධිත තත්ත්වය , ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි. | සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා සමෘද්ධි දෙපාර්තමේන්තුව පරිසනක හදිසි ප්‍රතිචාර සංරචක මගින් (ERC) ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවනාධාර හා වකුගඩු රෝගීන් පිළබඳ තොරතුරු රැස් කරයි.ආබාධිත ප්‍රජාව පිළිබඳ දත්ත රැස්කිරීම ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 2023 සංගණනයේ දී සිදු කිරීමට අපේක්ෂාවෙන් සිටී. | අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, අභිසංවර්ධනය, ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන | ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, සංවර්ධනය ආරක්ෂා කිරීම සඳහා මහ ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු අදාළ ප්‍රාදේශීය | වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු ප්‍රමානවත් පරිදි ඉටුකල යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාල පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | ලේකම් කාර්යාලයට අනුයුක්ත සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී (සමාජ සේවා) විසින් සිදුකරනු ලැබේ මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් ද ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරනු ලැබේ. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනයට , අභිසංවර්ධනයට හා ආරක්ෂා කිරීමට වගබලා ගැනීම වෙනුවෙන් වූ පහත දැක්වෙන කාර්යයන් ඉටුකිරීමට ජාතික සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | | |
| (අ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම. | නව පනතක් හා සංඥා භාෂා පනතක් කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රය සකස් කර අවසන් කර ඇත. | අබාධිත ප්‍රජාවගේ සුභසාධන වෙනුවෙන් ආන්ඩුවට උපදෙස් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ආ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාල ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම. | ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත කෙටුම්පත් කර ඇත. | ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුකූලව ආණ්ඩුව කටයුතු කරන බවට සුපරීක්ෂනය කල යුතුය. |
| (ඇ)අබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර | මේ පිළිබඳව සිදුකරන ලද අධ්‍යයන වලින් පසු ඔටිසම් තත්ත්වයේ දරුවන් සමාජගත කිරීමේ වැඩ පිළිවලක් සකස් කර පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක | ආබාධ වලට හේතු සහ ඒවා වැළැක්වීමට හා පාලනයට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රවර්ධනය කිරීම. | පිහිටුවා ඔවුන් සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමේ වැඩ පිළිවලක් සකස් කර ඇත. | |
| (ඈ) ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා ගතයුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරීම. | ආබාධ සහිත දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත. පළමු මධ්‍යස්ථානය මේ වන විට අකුරැස්ස ප්‍රදේශයේ ලෝක බැංකු ආධාර මත ඉදිකරමින් පවතී. | පුනරුත්ථාපනය කිරීමේ පියවර සැලසුම් කර ප්‍රවර්ධනයට කටයුතු කල යුතුය. |
| (ඉ) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම. | ලෝක බැංකු ආධාර යටතේ අකුරැස්ස ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානයේ මේ වන විට ඉදිකිරීම් අවසන් අදියරේ පවතී. ඉදිකිරීම් අවසන් වූ පසු පුනරුත්ථාපන කාර්යයන් ආරම්භ කිරීමට සැළසුම් කර ඇත. | අබාධිත ප්‍රජාව සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු කල යුතුය. |
| (ඊ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම. | 600 දෙනෙකුට රැකවරණය සැලසිය හැකි පරිදි රැකවරණ මධ්‍යස්ථාන හයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සමාජ සේවා ආයතන, විදාතා මධ්‍යස්ථාන, පෞද්ගලික ආයතන හා විශේෂ පාසල් වෙත ආබාධිත තැනැත්තන් යොමු කර අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව ලබා දෙනු ලැබේ. | අබාධිත ප්‍රජාව රැකබලාගැනීම අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීමේ අරමුණු සාක්ශාත් කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙල හඳුන්වාදීම සහ තොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබාගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | ගොඩනැගිලි ඉදිකිරීමේ දී අදාළ කර ගනු ලබන නිර්ණායක ඇතුලත් ප්‍රවේශ පහසුකම් සැපයීම පිළිබඳව ගැසට් පත්‍රය පලකිරීම් කටයුතු හා ආබාධ සහිත ප්‍රජාවට තොරතුරු දැනගැනීමට හා ඔවුනගේ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා හදිසි ඇමතුම් දුරකථන අංකයක් ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. | අබාධිත ප්‍රජාවට ආයතන වලට පිවිසීමට හා තොරතුරු සන්නිවේදන පහසුකම් ලබාදීමට කටයුතු කල යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 9 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අතිරික්ත මුදල් ජාතික සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වුව ද ඉකුත් වර්ෂ 05ක කාලය තුල ලබාදී තිබුණු රජයේ ප්‍රදාන වලින් උපයෝජනය නොකළ අරමුදල් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබූ මුදල් ශේෂය පිළිවෙලින් රු.7,694,935, රු.9,636,186, රු.9,998,552 , රු.12,062,703, රු.8,282,337,ක් හා රු.5,170,082ක් විය. මෙම අතිරික්ත මුදල් ශේෂයන් සුරැකුම්පත්වල හෝ වෙනත් ආයෝජන මාර්ගයක ආයෝජනය කර මහලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විවිධ කේෂත්‍රවල නිපුණතා දක්වන ආබාධිත තැනැත්තන් දිරිගැන්වීම සඳහා මුදල් ත්‍යාග ලබාදීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අරමුදලෙහි පවතින ශේෂයෙන් වියදම් දැරීමට තීරණය කරන ලදී.අග්‍රිම ලැබීම් ප්‍රමාදවන විට ක්‍රියාකාරී සැලැස්මට අදාළ කාර්යයන් අඛන්ඩව හා අප්‍රමාදව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත තාවකාලිකව සපයා ගැනීම හා ප්‍රාග්ධන භාණ්ඩ අමාත්‍යාංශය වෙතින් සපයා ගැනීමට නොහැකි වන අවස්ථාවලදී ජාතික සභාවේ අනුමැතිය ලබාගෙන අවශ්‍ය සැපයීම් කිරීමට අරමුදල් ශේෂය භාවිතයට ගැනීමට සඳහා පෙර වර්ෂවල භාවිතා කල<br>අරමුදල් ශේෂය භාවිතා කිරීමට සිදුවිය හැකිය.<br>එබැවින් 2021.12.31 දිනට රු.5,170,082 ක් වන අරමුදල් ශේෂය බාහිර ආයතනයක ආයෝජනය කිරීම අපහසු බවත් කෙසේ වෙතත්, ජාතික සභාවේ තීරණ අනුව ඉදිරි කටයුතු කරන බවත් දන්වමි. | අතිරික්ත මුදල් ආයෝජනය කර මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වී | නිර්දේශය |
| --- | --- | --- |
| 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව<br>සංස්ථාපිත ආයතනයක් ලෙස මහලේකම් කාර්යාලය පිහිටුවා තිබියදී රේඛීය රාජ්‍ය අමාත්‍යාංශයේ හා වෙනත් දෙපාර්තමේන්තු වල නිලධාරීන් | මහ ලේකම් කාර්යාලය අමාත්‍යාංශයේම අංශයක් ලෙස ක්‍රියාත්මක වන හෙයින් අමාත්‍යාංශය විසින් වැටුප් ගෙවනු ලැබේ. ජාතික සභාවට අදාළ විගණන විමසුම ඉදිරිපත් කරන ලද අතර මහ ලේකම් කාර්යාලය තවදුරටත් අමාත්‍යාංශයේම අංශයක් ලෙස | මහ ලේකම් කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ස්ථිර කාර්ය මන්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| හා සේවකයින් අභ්‍යන්තර අනුයුක්ත කිරීම් කරවාගෙන එම නිලධාරීන් හා සේවකයන් සඳහා වැටුප් හා දීමනා එකී බාහිර ආයතන වලට පවරා තිබුණි. මහ ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්තව රාජකාරී කළ නිලධාරීන් 24 දෙනෙකු සඳහා 2020 හා 2021 වර්ෂ වලදී පිළිවෙලින් රු.12,283,323ක් හා රු.13,989,629ක් වශයෙන් එකතුව රු.26,272,952ක් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකිය හා ව්‍යාපර සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය විසින් වැටුප් ගෙවා තිබුණි. එසේම මහ ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්ත කර සිටි එක් නිලධාරියෙකු සඳහා සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් වැටුප් වශයෙන් 2020 හා 2021 වර්ෂ වලදී පිළිවෙලින් රු.598,201ක් හා රු.607,900ක් වශයෙන් එකතුව රු.1,206,101ක් ද ගෙවා තිබුණි. | ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් නොවීය. | |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 30 දිනට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලය 40ක් වූ අතර 2022 මැයි 30 දින වන විටත් පුරප්පාඩු පැවති තාක්ෂණ නිලධාරී, සංඥා භාෂා පරිවර්තක හා බ්‍රේල් උපදේශක යනාදි තනතුරු 14ක් සඳහා නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. | සංඥා භාෂා පරිවර්තක නිලධාරීන් බඳවා ගැනීම් පටිපාටියේ වැටුප්තල සංශෝධන සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිඛිත ඉල්ලීමක් කර ඇත.<br>තාක්ෂණ නිලධාරීන් හා බ්‍රේල් උපදේශක තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය බඳවා ගැනීම් පටිපාටිය සකස් කිරීමේ කටයුතුවල අවසන් අදියරේ ඇත. | පුරප්පාඩු තනතුරු සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගෙන කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |